2018 අප්‍රේල් 01 යොමු අංකය: 1718-035

දයාබර දෙමව්පියන් වෙත,

**2018 වෙසක් පෙරහැර ඩුබායි - (ශ්‍රී බුද්ධ වර්ෂ 2562 ශ්‍රී සම්බුද්ධත්ව වර්ෂ 2607)**

ඩුබායි දහම් පාසල සංවිධානය කරන 2018 වසරේ වෙසක් උත්සවයේ ළමා වෙසක් පෙරහැර 2018 මැයි 4 වැනිදා, සිකුරාදා සවස 4.30ට ඩුබායිහි ලතීෆා රෝහල් කාන්තා සමාජ ක්‍රීඩා පිටියේ දී ආරම්භ වේ.

මෙම පෙරහැර සඳහා පහත සඳහන් අංගයන් සඳහා සහභාගී වන සියලුම දරුවන් මෙම අප්‍රේල් 13 වැනිදා, සිකුරාදා දිනට පෙර **ප්‍රියංකා නැන්දා හෝ මධුරී නැන්දා** හෝ අමතා තමන්ගේ නම, පන්තිය, ලියා පදිංචි අංකය සහ සහභාගී වන අංගය ලබා දෙන්න.

- <u>කසකරුවන්</u>
  සුදු සරම - රතු බඳ පටිය, සුදු බැනියම - ඔලුවට සුදු ජටාව පැළඳිය යුතුයි.
- <u>බෙරකරුවන්</u>
  සැකසූ ඇඳුම් ඇඳගෙන පෙරහරට සහභාගී වන්න. (බෙරද රැගෙන් ආ යුතුයි)
- <u>රජවරුන් සහ නිළමේවරුන්</u>
  සැකසූ ඇඳුම් ඇඳගෙන පෙරහරට සහභාගී වන්න.
- <u>ගිණිබෝල කරුවන්</u>
  3 දෙනෙකු අවශ්‍යයි. ගිනි පත්තු නොකෙරේ. සහභාගී වීමට කැමති ළමුන් නම් ලබා දෙන්න.
- <u>මල් රැගෙන පෙරහරේ යන ළමින්</u>
  මල් පැපොල් ගෙඩියේ ගසා පිළියෙළ කරගෙන් පැමිණිය යුතුයි
- <u>මල් බයිසිකල් කරුවන්</u>
  සැරසූ මල් බයිසිකල් රැගෙන ආ යුතුයි
- <u>සේසත් රැගෙන යන ළමුන්</u>
  පොඩි සේසත් 10ක් සහ ලොකු සේසත් 12ක් ඇත. කැමති ළමුන් නම් ලබා දෙන්න.
- <u>ලොකු, පොඩි බෞද්ධ කොඩි රැගෙන යන ළමුන්</u>
  ලොකු, පොඩි බෞද්ධ කොඩි රැගෙන යාමට කැමති ළමුන් නම් ලබා දෙන්න.

(පෙරහැර අවසානයේදී දහම් පාසලෙන් සපයා දුන් සියලුම කොඩි, සේසත්, මල් සැරසිලි ආදිය වේදිකාව අසල සිටින දහම් පාසලේ නැන්දා හෝ මාමාට නොවරදවාම භාර දෙන්න.)
තෙරුවන් සරණයි!

ප්‍රියංකා නැන්දා
පෙරහැර සංවිධායක මණ්ඩලය වෙනුවෙන්

**පෙරහැර විමසීම්: ප්‍රියංකා: 0555 287 652, 050 47 614 64, මධුරි: 056 971 5303**
email: ප්‍රියංකා: priyanka20nga@gmail.com , මධුරි: madhuri.karunarathna@gmail.com

ස්තුතියි,
සංවිධායක මණ්ඩලය